ඇමුණුම (02)

අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 43/2019

මගේ අංකය :ඊඩී/04/58/01/05/93(iv)

අධ්‍යාපන අමාත්‍යාංශය

"ඉසුරුපාය"

බත්තරමුල්ල.

2019 ඔක්තෝම්බර් මස 16 දින

සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

විභාග කොමසාරිස් ජනරාල්,

අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2141/6 හා 2019.09.16 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුලත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට සහ දෙවන (II ) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේ අවම සේවා කාලය සංශෝධනය කිරීමට අදාළ විධිවිධාන ඇතුලත් කර අංක 2141/6 හා 2019 සැප්තැම්බර් 16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ දෙවන සේවා ව්‍යවස්ථා සංශෝධනය අනුව දැනට සේවයේ සිටින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් කිරීම් පහත පරිදි සිදු කරනු ලැබේ.

**01. තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට උසස් කිරීම.**

1.1) 2019 පෙබරවාරි මස 26 දිනට පෙර සේවයට බඳවා ගෙන ඇති නිලධාරීන් සංශෝධිත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 10.1.1 හි අනු අංක (v) යටතේ සඳහන් අධ්‍යාපන කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය හැර 10.1.1 යටතේ සඳහන් අනෙකුත් සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දිනය හෝ 2019 පෙබරවාරි මස 26 දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

1.2) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 10.1.1 හි අනු අංක (iii) යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට

අනුශාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති සහන කාලය තුල සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් නියමිත දිනට අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන් ලෙස සලකනු ලැබේ.

1.3) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 10.1.1 හි අනු අංක (iii) යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති සහන කාලය තුල සම්පූර්ණ නොකරනු ලබන නිලධාරීන් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ඇතුලුව මෙම චක්‍රලේඛනයේ 1.1 හි සඳහන් සියළුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට 11 ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

1.4) පහත සඳහන් සුදුසුකමක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 10.1.1 හි අනු අංක (vi) යටතේ දක්වා ඇති පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු ලෙස සලකනු ලැබේ.

(අ) අධ්‍යාපනවේදී උපාධිය ලබා තිබීම.
(ආ) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් ලබා තිබීම.
(ඇ) අධ්‍යාපන කළමනාකරණය හෝ බඳවාගත් විෂයයට අදාළ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

<u>සටහන 01</u>

1. අංක 1928/28 හා 2015 අගෝස්තු 21 දිනැති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථාවේ අන්තර් කාලය තුල හෝ ඊට පෙර අංක 1225/32 හා 2002.03.01 දිනැති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පැරණි සේවා ව්‍යවස්ථාව අනුව දෙවන භාෂා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබ ඇති නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ 10.1.1 හි අනු අංක (iv) යටතේ වූ සන්ධාන භාෂාව අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන් ලෙස සලකනු ලැබේ.

**02. දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීම.**

2.1) සේවා ව්‍යවස්ථාවේ දෙවන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට II ශ්‍රේණියේ සිටින නිලධාරීන්ට සහ 111 වන ශ්‍රේණියේ වසර හය (06) කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට

(අ) 11 ශ්‍රේණියේ සිට 1 ශ්‍රේණියට උසස් වීම සඳහා ලබා තිබිය යුතු 10.2.1 හි අනු අංක (vi) යටතේ සඳහන් පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කර ගැනීම සඳහා 11 ශ්‍රේණියට උසස්වී වසර හත (07) ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනය හෝ 2024.10.16 දිනය යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා සහන කාලයක් ලබා දෙනු ලබන අතර එම සහන කාල සීමාව තුල දී පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව 10.2.1 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

<u>සටහන 02</u>

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් සේවා ව්‍යවස්ථාවේ 10.2.1 යටතේ දක්වා ඇති

යටතේ හෝ බඳවා ගත් විෂයය ක්ෂේත්‍රයට අදාළව හෝ අධ්‍යාපන ක්ෂේත්‍ර යටතේ හෝ පශ්චාත් උපාධියක් ලබා තිබීම මගින් සේවා ව්‍යවස්ථාවේ 10.2.1 හි අනු අංක (vi ) යටතේ සඳහන් පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කළ යුතුය.

(ආ) 11 ශ්‍රේණියේ සිට 1 ශ්‍රේණියට උසස්වීම සඳහා ලබා තිබිය යුතු 10.2.1 හි අනු අංක (ii) යටතේ වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර ගැනීම සඳහා 11 ශ්‍රේණියට උසස් කරනු ලැබූ දිනයේ සිට වසර තුන (03) ක සහන කාලයක් ලබා දෙන අතර එම සහන කාල සීමාව තුල දී අදාළ සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව 10.2.1 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

සටහන 03

(1) අංක 1225/32 හා 2002.03.01 දිනැති පූර්ව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ දෙවන කාර්යක්ෂමතා කඩඉම යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණකර ඇති 2015.08.21 දිනට පෙර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගෙන ඇති නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ 10.2.1 හි අනු අංක (II) යටතේ වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන් ලෙස සලකනු ලැබේ.

2.2) සේවා ව්‍යවස්ථාවේ දෙවන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට II ශ්‍රේණියේ සිටින නිලධාරීන් 1 ශ්‍රේණියට උසස් කිරීමේදී සේවා ව්‍යවස්ථාවෙහි 10.2.1 හි (i) සහ (v) යටතේ සඳහන් කර සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

(අ) 11 ශ්‍රේණියේ වසර දෙක (02) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා 11 ශ්‍රේණියට උසස්වීමෙන් පසු වැටුප් වර්ධක දෙකක් (02) ක් උපයාගෙන තිබීම.

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව 11 ශ්‍රේණියට උසස්වීමෙන් පසු උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දෙකක් (02) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

2.3) සේවා ව්‍යවස්ථාවේ දෙවන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට 111 ශ්‍රේණියේ වසර හය (06) කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම චක්‍රලේඛයේ 1.1 හි දක්වා ඇති විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් 1 ශ්‍රේණියට උසස් කිරීමේදී සේවා ව්‍යවස්ථාවේ 10.2.1 හි (i) සහ (v) යටතේ සඳහන් කළ සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

(අ) 111 සහ 11 ශ්‍රේණිවල වසර දොළහ (12) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක එකොළහ (11) ක් උපයාගෙන තිබීම.

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර වසර දොළහ (12) ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

සටහන 04

(1) 2019 පෙබරවාරි මස 26 දිනට පෙර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 වන ශ්‍රේණියේ වසර හය (06) කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම චක්‍රලේඛයේ 1.3 හි සඳහන් විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කරනු ලැබූ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේදී එම නිලධාරීන් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සඳහා ගනු ලැබූ අමතර කාල සීමාවට සමාන කාල සීමාවකින් එම නිලධාරීන්ගේ I ශ්‍රේණියට උසස් කිරීම ප්‍රමාද කරනු ලැබේ.

2.4) 2019 පෙබරවාරි මස 26 දිනට පෙර 111 ශ්‍රේණියේ වසර හය (06) ක් සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් 1 ශ්‍රේණියට උසස් කිරීමේ දී ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 10.2.1 හි අනු අංක (iii) යටතේ සඳහන් අවශ්‍යතාවය සලකා බලනු නොලැබේ.

**මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව නිකුත් කරනු ලැබේ.**

එම්.එන් රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය